රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
Ministry of Public Administration and Management
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

| | | |
|---|---|---|
| දුරකතන / தொலைபேசி / Telephone: (94) 011-2696211-13 | ෆැක්ස් / தொலைநகல் / Fax: (94) 011-2699720 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: minister@pubad.gov.lk |
| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date: 2015.12.28 |


**ජගත් සම්මානයෙන් පිදුම් ලද ප්‍රවීන ලේඛක චූලානන්ද සමරණායක මහතාට රාජ්‍ය සේවයේ මහගෙදරින් හරසර.**

රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලද ප්‍රවීන ලේඛක චූලානන්ද සමරණායක මහතාට පසුගියදා ජාත්‍යන්තර සාහිත්‍ය සම්මානයක් හිමිවිය. ඒ එංගලන්තයේ පිහිටා ඇති චිංගීස් අයිත්මාතොෆ් ඇකඩමිය මගින් පිරිනමන චිංගීස් අයිත්මාතොෆ් ජාත්‍යන්තර සම්මානයයි. මෙම සම්මානය පසුගිය 10 වෙනිදා ලන්ඩනයේ වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තුවේදී එරට සිටින මොන්ගෝලියානු තනාපතිනිය විසින් චූලානන්ද මහතා වෙත ප්‍රදානය කෙරුණි.චූලානන්ද සමරණායක මහතාව මෙම සම්මානය සඳහා තෝරා ගෙන ඇත්තේ ශ්‍රේෂ්ඨ රුසියානු ලේඛක චිංගීස් අයිත්මාතොෆ් ගේ රුසියානු නවකථා රැසක් සිංහළ බසට පරිවර්තනය කරමින් සිදුකරන ලද විශිෂ්ඨ සාහිත්‍ය මෙහෙවර අගයකිරීමක් වශයෙනි. මින් පෙර මෙම සම්මානය කිසිඳු ලාංකීය සාහිත්‍යකරුවෙකු විසින් හිමිකර ගෙන නොතිබීමද විශේෂයකි.මෙම ජාත්‍යන්තර සම්මානය හිමිවීමත් එතුලින් රටට අත්කර දුන් කීර්තියත් ඇගයීම සඳහා වූ පිළිගැනීමේ උත්සවයක් පසුගියදා චූලානන්ද සමරණායක මහතා සේවය කරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙදී අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. මෙහිදී චූලානන්ද සමරණායක මහතාගේ සාහිත්‍ය මෙහෙවර ඇගයීමකට ලක්වූ අතර තිළිණ ප්‍රදානයක්ද අමාත්‍යවරයා අතින් සිදුවිනි.මෙම අවස්ථාවට අමාත්‍යාංශ ලේකම් ජේ. දඩල්ලගේ මහතා ඇතුළු නිලධාරීන් රැසක් එක්ව සිටියහ.

**බන්දු යෝගානන්ද**
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමන්ගේ මාධ්‍ය ලේකම්